නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
Ministry of Housing & Samurdhi

4 මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 ஆம் மாடி, செத்சிரிபாய, பத்தரமுல்ல.
4 floor, Sethsiripaya, Battaramulla.

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

මගේ අංකය / எனது இல / My No: DDD/HO/04/Circular
ඔබේ අංකය / உமது இல / Your No: ..................
දිනය / திகதி / Date: 2015.06.18

**දිවිනැගුම චක්‍රලේඛ අංක:- 2015/07-I**

**සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්**
**සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් වෙත,**

## දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2015

උක්ත මැයෙන් මාගේ සමාංක හා 2015.06.08 දිනැතිව ඔබ වෙත එවන ලද දිවි නැගුම චක්‍ර ලේඛ අංක 2015/07 හා බැදේ.

02. එම චක්‍ර ලේඛයේ අංක 07 යටතේ "ප්‍රතිපාදන" යනුවෙන් දැක්වෙන ඡේදයේ ප්‍රතිපාදන සීමාවන් හා නිර්ණායක සම්බන්ධව විස්තර දැක්වෙන සටහනේ අනු අංක 02 හා 03 පහත පරිදි සංශෝධනය කරනු ලැබේ. ඒ අනුව ජීවනෝපාය චක්‍රීය අරමුදලට ආපසු අයකර ගැනීමේ පදනම මත ලබාදීමට නියමිත ව්‍යාපෘති ඇස්තමේන්තුවෙන් 50% ක වටිනාකම ඔබ දිස්ත්‍රික්කයේ ජීවනෝපාය චක්‍රීය අරමුදලෙහි ප්‍රමාණවත් ශේෂයක් පවතින සෑම විටම එම අරමුදලෙන් ණයක් වශයෙන් ලබාදිය යුතු වේ.

| අනු අංකය | ප්‍රතිපාදන සීමාව | නිර්ණායක | ව්‍යාපෘතියේ උපරිම මූල්‍ය වටිනාකම(රු) |
|---|---|---|---|
| 01 | ව්‍යාපෘති ඇස්තමේන්තු මුදලෙන් උපරිම වශයෙන් 90% ක් ප්‍රදානයක් ලෙස ලබා දීම. (අවම වශයෙන් 10% ක් ප්‍රතිලාභියා විසින් දායක කළ යුතුය.) | • ආර්ථික දායකත්වයක් ලබාදිය නොහැකි ලෙස දිගුකාලින රෝග වලින් පෙලෙන්නන් සිටින (වකුගඩු, පිළිකා වැනි රෝගවලින් පෙලෙන, ඔත්පලවූ වයස්ගත මව් පියන් සිටින) අඩු ආදායම් ලාභී පවුල්.<br>• දිගුකාලීන ආබාධිත තත්ත්වයන්ගෙන් පෙලෙන සාමාජිකයින් සිටින අඩු ආදායම් ලාභී පවුල්.<br>• ආර්ථික වශයෙන් බලවත් පීඩාවන්ට ලක්වූ වැන්දඹු/ කාන්තා මූලික අඩු ආදායම් ලාභී පවුල්. | 50,000/= |

දුරකථන/ தொலைபேசி/Telephone:
ෆැක්ස්/ தொலைமடல்/Fax:
ඊ-මේල්/ மின்னஞ்சல்/ E-Mail:

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General — 011-2872202, 011-2889002, dgdivineguma@gmail.com
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி / Additional Director General — 011-2861994, anuradhakum@yahoo.com
අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) — 011-2873799, 011-2873996, hrddivineguma@gmail.com
කාර්යාලය / அலுவலகம் / Office — 011-2889046

| | | | |
|---|---|---|---|
| 02 | ව්‍යාපෘති ඇස්තමේන්තු මුදලින් උපරිම වශයෙන් 40% ක් ප්‍රදානයක් වශයෙන් ලබා දිය හැකි අතර සෘජු ප්‍රතිලාභී දායකත්වය අවම වශයෙන් 10% ක් විය යුතුය. ඉතිරි 50% ක මුදල ජීවනෝපාය චක්‍රීය අරමුදල මඟින් ලබාදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. | • ආර්ථික හා සමාජයීය වශයෙන් අවාසි සහගත තත්ත්වයට පත්ව ඇති අඩු ආදායම්ලාභී පවුල් (වසමේ දිවිනැගුම සංවර්ධන නිලධාරීන් විසින් අඩු ආදායම්ලාභියෙකු බවට සහතික කළ යුතුය.) | 75,000/= |
| 03 | ව්‍යාපෘති ඇස්තමේන්තු මුදලින් 50% ක ප්‍රතිපාදන ජීවනෝපාය චක්‍රීය අරමුදලෙන් ලබාදී ඉතිරි 50% ක මුදල අදාළ ප්‍රතිලාභියා විසින් දැරීම මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. | • ගෙවීම් හැකියාව ඇති යම් සතුටුදායක ආදායම් මට්ටමකට පැමිණි අඩු ආදායම් ලබන ප්‍රතිලාභීන් සහ දිවිනැගුම වැඩසටහන සඳහා ඒකාබද්ධ වීමට කැමැත්තක් දක්වන අඩු ආදායම් ලබන ප්‍රතිලාභීන් සඳහා. | 75,000/= |
| 04 | දිවිනැගුම ප්‍රජා මූල බැංකු / වෙනත් බැංකු ණය පහසුකම් ලබාදීමට අවශ්‍ය මඟපෙන්වීම සිදුකිරීම. | • වඩා වැඩි ආර්ථික වර්ධනයක් අපේක්ෂිත ප්‍රතිලාභීන් සඳහා. | |

03. තවද එම චක්‍ර ලේඛයේ අංක 05 යටතේ “ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය” යනුවෙන් දැක්වෙන ඡේදය මඟින් ලබාදී ඇති උපදෙස් වල අඩංගු 5.3 කරුණ පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

5.3. මෙම ව්‍යාපෘති යෝජනා දිවිනැගුම සංවර්ධන නිලධාරි, කලාප කළමණාකරු සහ ව්‍යාපෘති කළමණාකරුගේ නිර්දේශය සහිතව මූලස්ථාන කළමණාකරු වෙත ඉදිරිපත් කළ යුතුය.

මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබ ඇතුළු නිලධාරින්ගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කරමි.



ධම්මික ගුණවර්ධන
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)

පිටපත්:-

1. සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා -කාරු.දැ.ගැ.ස
2. සියළුම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා -කාරු.දැ.ගැ.ස
3. ලේකම්, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය -කාරු.දැ.ගැ.ස
4. අතිරේක ලේකම් (දිවිනැගුම), නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය -කාරු.දැ.ගැ.ස
5. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව -කාරු.දැ.ගැ.ස
6. ප්‍රධාන ගණකාධිකාරි දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -කාරු.දැ.ගැ.ස
7. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -කාරු.දැ.ගැ.ස
8. සියළුම අංශ ප්‍රධානීන් , දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -අ.කා.ස
9. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් -කාරු.දැ.ගැ.ස හා අ.කා.ස
10. සියළුම දිවිනැගුම මූලස්ථාන කළමණාකරුවන් - අ.කා.ස හා දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමණාකරුවන් සහ දිවිනැගුම සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා